# සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2025

**නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යංශය**

## ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති විසින්, සැපයුම්කරුවන්/ බලයලත් නියෝජිතයින්/ කොන්ත්‍රාත්කරුවන් / දේශීය නිෂ්පාදකයින් සහ සේවා සපයන්නන්ගෙන් පහත ලැයිස්තුගත කාණ්ඩ යටතේ 2025 වසර තුළ භාණ්ඩ හා සේවා සැපයීම සඳහා ලියාපදිංචි වීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය | 19 | PVC Pipes & Fittings |
| 2 | පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, කැමරා, දුරකථන | 20 | Safety Items |
| 3 | CCTV Cameras & Accessories | 21 | Fire Extinguisher Items |
| 4 | IT Software Solutions | 22 | වාහන සහ යන්ත්‍ර අමතර කොටස් |
| 5 | කාර්යාලීය ගෘහ භාණ්ඩ | 23 | Repairs / Vehicle Service |
| 6 | යන්ත්‍රෝපකරණ, පොම්ප සහ බල මෙවලම් | 24 | උත්සව අයිතම සහ ආහාරපාන සේවා කුලියට ගැනීම |
| 7 | විදුලි / ඉලෙක්ට්‍රොනික අයිතම | 25 | වාහන කුලියට ගැනීම |
| 8 | Air Conditions | 26 | Contract & Works |
| 9 | Generators & Spares | 27 | Timber & Plywood |
| 10 | Solar Panels & Spares | 28 | Engineering Material Testing Equipment |
| 11 | සුභසාධන අයිතම / පාරිභෝගික භාණ්ඩ හා සේවා | 29 | Gym Equipmen |
| 12 | Painting and Related Items | 30 | Children Play Items |
| 13 | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය | 31 | Converted Container Cabins |
| 14 | Ready Mix Concrete | 32 | මින්මැදුරු උපකරණ (පෙරහන් සහ උපාංග)/ මාලු කෑම |
| 15 | Pre-cast Concrete Items | 33 | Training Institutions |
| 16 | Paints & Waterproofing Materials | 34 | උපදේශන සේවා |
| 17 | Tile & Bathware Fittings | 35 | Industrial Gas and Chemical |
| 18 | Hardware Items | 36 | Survey Instruments |

**<u>අයදුම්පත ලබා ගැනීම සහ ඉදිරිපත් කිරීම</u>**

1. සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත් www.landdevelopment.lk වෙබ් අඩවියෙන් නොමිලේ බාගත කර ගත හැකිය.

2. ලියාපදිංචි වීමට කැමති සැපයුම්කරුවන් පහත සඳහන් පරිදි සෑම ප්‍රධාන කාණ්ඩයකටම ආපසු නොගෙවන රු. 2,500.00 ක ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය. ගෙවීම් සිදුකිරීම සඳහා ඍජු මුදල් තැන්පතු ක්‍රමවේදය මගින් (Direct cash deposit) ගිණුම් අංක. **3271113,** ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව නමින්, ලංකා බැංකුව, රාජගිරිය ශාඛාව වෙත ගෙවීම් කළහැකි අතර, එසේ නොමැති නම්, අප ආයතනයේ මුදල් අංශයේ මුදල් අයකැමි වෙත ගෙවීම් කල හැක. වැඩිදුර විමසීම් සහ විස්තර සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැපයුම්) දුරකථන අංක 0112 866832/ 0112 863705-268.

3. නිසි පරිදි පුරවන ලද අයදුම්පත සමඟ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය, අධ්‍යක්ෂක මණ්ඩලයේ නම් සඳහන් ලේඛණය, ගෙවීම් කරනලද රිසිට් පතෙහි මුල් පිටපත සහ වැට් බදු ලියාපදිංචි කිරීමේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. සිවිල් කොන්ත්‍රාත්කරුවන් සඳහා CIDA ලියාපදිංචි සහතිකය ද ඉදිරිපත් කළ යුතුය.

4. ලියාපදිංචිය සඳහා අයදුම්කරු භාණ්ඩ නිෂ්පාදකයා, වෙළඳ ලකුණෙහි හිමිකරු/එකම නියෝජිතයකු වන විට ඒ සඳහා බලය පවරන ලිපියේ පිටපතක් ඉදිරිපත් කල යුතුය.

5. සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වන ලියකියවිලි 2024 දෙසැම්බර් 31 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව 3.30 දක්වා ඕනෑම වැඩ කරන දිනයකදී ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සැපයුම් අංශයට ඉදිරිපත් කළ හැකිය.

6. අයදුම්කරු ලියාපදිංචිය බලාපොරොත්තු වන භාණ්ඩයේ/භාණ්ඩවල සැබෑ අලෙවිකරුවෙකු දැයි සොයා බැලීමට ලියාපදිංචියට අවශ්‍ය නම් ව්‍යාපාර පරිශ්‍රයන් පරීක්ෂා කිරීමක් සිදුකරනු ලැබේ.

7. සාමාන්‍යයෙන් සැපයුම් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. එසේ වුවද, අවශ්‍යතා පදනම්ව ලියාපදිංචි වී නොමැති අනෙකුත් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමට සහ මිලදී ගැනීම් සිදු කිරීමට SLLDC අයිතිය ඇත.

8. භාණ්ඩ සැපයීම සඳහා ඔහු/ඇය තෝරාගනු ලබන අවස්ථාවක අවම වශයෙන් දින 30 ක ණය කාල සීමාවක් ලබා දීමට අයදුම්කරු එකඟ විය යුතුය.

9. ලංසු ආරාධනා සඳහා ප්‍රතිචාර නොදැක්වීම හෝ ප්‍රදානයන් සඳහා භාණ්ඩ හා සේවා ලබා දීමට අපොහොසත් වීම මෙන්ම, සපයන ලද භාණ්ඩ හා සේවා නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවීම යන කරුණු මත දැනුම්දීමකින් තොරව සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අහෝසි විය හැක.

**සභාපති**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**
**අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය**
දුරකථන අංකථන 011-2889485 – 7 වෙබ්: www.landdevelopment.lk